# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1649/3 - 2010 අප්‍රේල් 12 වැනි සඳුදා - 2010.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**2005 ඉඩම් මැනුම් සභා (ලියාපදිංචි කිරීමේ) නියෝගය සංශෝධනය කිරීම**

2005 නොවැම්බර් 23 දින නිකුත් කරන ලද අංක 1420/20 දරන ගැසට් නිවේදනයෙහි ප්‍රකාර 2002 අංක 17 දරන මැනුම් පනතේ 39 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 65 වැනි වගන්තිය යටතේ මා විසින් අනුමත කරන ලද "2005 ඉඩම් මැනුම් සභා (ලියාපදිංචි කිරීමේ) නියෝගයෙහි" 2(2) ඡේදයට පහත උපඡේද ඇතුළත් කර සංශෝධනය කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

ජොන්ස්ටන් ක්ෂෙවියර් ප්‍රනාන්දු,
ඉඩම් හා ඉඩම් සංවර්ධන, ජනාවාස හා රණවිරු සුභසාධන අමාත්‍ය.

2010 මාර්තු මස 05 වැනි දින,
කොළඹ.
ඉඩම් හා ඉඩම් සංවර්ධන, ජනාවාස හා රණවිරු සුභසාධන අමාත්‍යාංශයේ දීය.

*(ඉ)* එහෙත් එකී මිනින්දෝරුවරයා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඔහු/ඇය ඉහත "ඈ" උපඡේදයේ සඳහන් ලියාපදිංචි ගාස්තු ගෙවීමෙන් නිදහස් වේ.

*(ඊ)* ඉහත "ඉ" උපඡේදයේ සඳහන් ලියාපදිංචි ගාස්තු ගෙවීමෙන් නිදහස් වන මිනින්දෝරුවරයෙක් තම සේවාකාලය අවසන් වීම නිසා හෝ වෛද්‍ය හේතුන් මත හෝ විශ්‍රාම යාම හැර වෙනත් ආකාරයකින් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවයෙන් ඉවත්වන්නේ නම් හෝ ඉවත් කරන්නේ නම් හෝ ඉහත "ඈ" උපඡේදයේ සඳහන් මුදල මැනුම් සභාව වෙත ගෙවීමෙන් ස්වකීය සහතිකය ලබා ගත යුතු ය.

04-625